**ශීර්ෂය 231 - ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 09 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජුලි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කර ගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරිමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.
- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිළධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

**(අ)** ඉකුත් වර්ෂයේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන වල සඳහන් ශේෂ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් කිරීමේ දී අවස්ථා 12 කට අදාලව එකතුව රු. 7,343,418 ක වෙනස්කම් නිරීක්ෂණය වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වී නොතිබුණි.

(ආ) මෙම වාර්තාවේ 1.6.2 ඡේදයේ සඳහන් නිරීක්ෂණය සම්බන්ධයෙන් ඉකුත් වර්ෂයේදී මා විසින් කර තිබුණු නිර්දේශ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී ද ක්‍රියාත්මක කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට ජුලි දක්වා කාලයට අදාල රු.34,921 ක තැන්පතු ලැබීම් සහ එකී කාලය තුළ රු.29,303 ක තැන්පතු ගෙවීම් පිළිබඳව භාණ්ඩාගාරයට වාර්තා කර නොතිබුණු බැවින් වර්ෂය අවසානයේ භාණ්ඩාගාර පොත් අනුව තැන්පත් ගිණුමේ රු.5,617 ක සෘණ ශේෂයක් විය. | 2019 දෙසැම්බර් 03 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 271/2019 හි 6 ඡේදය ප්‍රකාරව ඒසීඒ - 4 ආකෘතිය මඟින් 2019 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුමේ ශේෂය හා එදිනට භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අනුව තැන්පත් ගිණුමේ ශේෂය සමාන විය යුතුවේ. | ජනවාරි සිට ජුලි දක්වා වූ කාලයට අදාලව එකතු වූ පිටපත් ගාස්තු වලින් සියයට 30 ක් වූ නිලධාරීන්ගේ මුදල රු.34,921 ක් තැන්පත් ගිණුමේ ලැබීම් ලෙසත් රු.29,303 ගෙවීම්, තැන්පත් ගෙවීම් ලෙසත් සටහන් කර නොමැත. එබැවින් 2019 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුමේ ශේෂය රු.5,617 ක සෘණ අගයක් විය. |
| (ආ) විෂය අංක 23101 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් 'බී' ගිණුමේ සමාලෝචිත වර්ෂයේ මුළු ලැබීම් රු. 849,609 ක් වූ නමුත් එය මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ රු.449,978 ක් ලෙස දැක්වීම නිසා අත්තිකාරම් ලැබීම් රු. 399,631 ක් අඩුවෙන් දක්වා තිබුණි. | වර්ෂය තුළ දී මුදලින් හා හරස් සටහන් මඟින් ලැබුණු සියළුම අත්තිකාරම් ලැබීම් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ඇතුළත් කළ යුතුවේ. | සමාලෝචිත වර්ෂයේ ලැබීම් ලෙස මුදලින් අයකර ගත් රු.499,978 ක මුදල පමණක් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ දැක්වීම හේතුවෙන් රු.399,631ක් ( හරස් සටහන් මඟින් ලැබීම්) අඩුවෙන් සටහන් වී ඇත. |
| (ඇ) සමාලෝචිත වර්ෂය තුළ වෙනත් ලැබීම් වල මුළු එකතුව වූ රු. 767,618 න් පිටපත් ගාස්තු ලැබීම්වලින් නිලධාරීන්ට ගෙවන ලද | 2019 දෙසැම්බර් 03 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 271/2019 හි 7 **(ii)** ඡේදය ප්‍රකාරව ආදායම් ගණන්දීමේ නිලධාරීන් වෙනුවෙන් ආදායම් එකතු කරනු ලබන වෙනත් | සමාලෝචිත වර්ෂයේ දෙපාර්තමේන්තුවේ වෙනත් ලැබීම් රු.767,618ක් වූ අතර, පිටපත් ගාස්තු (රු.195,804) ලෙස ලැබීම් වලින් |

| | | | |
|---|---|---|---|
| | රු. 58,741 ක මුදල අඩු කර රු.708,877 ක් ගිණුම්ගත කර තිබීම නිසා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ වෙනත් ලැබීම් රු.58,741 ක් අඩුවෙන් දක්වා තිබුණි. | දෙපාර්තමේන්තු එම රැස් කළ ආදායම භාණ්ඩාගාරයෙන් ලද අක් මුදල් ලෙස සලකා ඒසීඒ - 03 ආකෘතියේ ඇතුළත් කළ යුතුවේ. | රු.58,741ක් වූ සියයට 30 ක ප්‍රමාණයක් දෙපාර්තමේන්තුවේ නිලධාරින්ට ගෙවනු ලබයි. එම මුදල පොදු තැන්පත් ගිණුමේ රඳවා නිලධාරීන්ට ගෙවනු ලබන බැවින් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ තැන්පතු යටතේ සටහන් කර ඇති වෙනත් ලැබීම් රු.708,877ක් ලෙස සටහන් කර ඇත. |
| **(ඇ)** | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ සඳහා වූ අයවැය ඇස්තමේන්තුව සහ මුළු වියදම දැක්වීමේ දී දේශීය ගමන් වියදම් සඳහා වූ රු.100,000 ක අයවැය ඇස්තමේන්තුව සහ ඊට අදාල රු. 55,330 ක මුළු වියදම ද ඇතුළත් කර දක්වා තිබුණි. ඒ හේතුවෙන් වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ ඇස්තමේන්තුව රු. 100,000 කින් හා වියදම රු. 55,330 කින් වැඩියෙන් දක්වා තිබුණු අතර අනෙකුත් භාණ්ඩ හා සේවා වියදම රු.55,330 කින් සහ ඊට අදාල අයවැය ඇස්තමේන්තුව රු.100,000 කින් අඩුවෙන් දක්වා තිබුණි. | 2019 දෙසැම්බර් 03 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 271/2019 හි 6 ඡේදය ප්‍රකාරව ඒසීඒ - එෆ් ආකෘතිය යටතේ පුනරාවර්තන වියදම් ඇතුළත් කිරීමේ දී ඒසීඒ - 2(**ii**) හි සටහන අංකය 05 යටතේ වූ වියදම් සහ සටහන 06 යටතේ වූ වියදම් වෙන වෙනම දැක්විය යුතුවේ. | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ සඳහා වූ අයවැය ඇස්තමේන්තුව සහ වියදම් සඳහා අතපසු වීමකින් ගමන් වියදම් සඳහා වූ ඇස්තමේන්තුව සහ වියදම ඇතුළත් කිරීම හේතුවෙන් රු.100,000 කින් ඇස්තමේන්තුවත්, රු.55,330 කින් වියදමත් වැඩි වී ඇත. අනෙකුත් භාණ්ඩ හා සේවා ඇස්තමේන්තුව රු.100,000 කින් හා වියදම රු.55,330කින් අඩුවෙන් සටහන් වී ඇත. |

**1.6.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෙපාර්තමේන්තුව සතු මෝටර් රථයක් පිළිබඳ තොරතුරු ඉකුත් වර්ෂයේ මෙන්ම සමාලෝචිත වර්ෂයේදී ද මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ ඇතුලත් කර නොතිබීම නිසා මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දේපළ පිරියත හා උපකරණ ශේෂයත්, දේපළ පිරියත හා උපකරණ සංචිත ශේෂයත් අඩුවෙන් දක්වා තිබුණි. | දෙපාර්තමේන්තුව සතු සියළුම මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කළ යුතුවේ. | අංක 300-5479 දරණ මෝටර් රථය භාවිතයට සුදුසු නොවන මට්ටමෙහි පවතින බැවින් එම මෝටර් රථය වෙන්දේසි කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. |

**1.6.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ)** සමාලෝචිත වර්ෂය තුළ ආදායම් නොවන ලැබීම් රු.767,618 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ රු.382,261 ක් ලෙස දැක්වීම නිසා මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය රු.385,357 කින් අඩුවෙන් දක්වා තිබුණි. | 2019 දෙසැම්බර් 03 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 271/2019 හි 7 **(ii)** ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | වර්ෂය තුළ එකතු වූ විශ්‍රාම වැටුප් දායක මුදලින් ලැබීම් වූ රු.246,226 ක්ද, ණය අවකරණ පොලී වශයෙන් ලැබීම් රු.84,940 ක් ද පිටපත් ගාස්තු ලැබීම් රු.58,741ක මුදලද අතපසුවීමකින් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආදායම් නොවන ලැබීම් ලෙස සටහන් නොකිරීම හේතුවෙන් ආදායම් නොවන ලැබීම් රු.389,907 ක් අඩුවෙන් දක්වා ඇත. තවද වැරදීමකින් රු.4550 ක රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් පියවීම සටහන් වීම හේතුවෙන් ආදායම් නොවන ලැබීම් රු.382,261 ක් ලෙස දෝෂ සහිතව සඳහන් වී ඇත. |

| | | |
|---|---|---|
| (ආ) මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතට සමාලෝචිත වර්ෂය තුළ රු.449,978 ක අත්තිකාරම් අයකර ගැනීම හා රු.1,499,436 ක අත්තිකාරම් ගෙවීම් ඇතුළත් කර නොතිබුණි. | 2019 දෙසැම්බර් 03 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 271/2019 හි 6 ඡේදය අනුව ඒසීඒ - සී ආකෘතියේ අත්තිකාරම් අය කර ගැනීම් හා අත්තිකාරම් ගෙවීම් ඇතුළත් කළ යුතුවේ. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සිදුවූ අතපසුවීමකින් ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ අත්තිකාරම් අය කර ගැනීම් රු.449,978 ක් හා ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය යටතේ අත්තිකාරම් ගෙවීම් රු1,499,436ක අගයන් ඇතුළත් කර නොමැත. |

### 1.6.4 අක්මුදල් ගැලපුම් ගිණුම

----------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 03 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 271/2019 හි 7 (vi) ඡේදය ප්‍රකාරව වූ අක්මුදල් ගැලපීම් ගිණුමක් දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කර නොතිබුණි. | 2019 දෙසැම්බර් 03 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 271/2019 හි 7 (vi) ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියට මෙවැනි දෝෂ නොවීමට කටයුතු කරන බව දන්වමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 සීමා ඉක්මවීම්

-----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විෂය අංක 23101 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ' බී ' ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබූ අවම ලැබීම් සීමාව රු.500,000 ක් වූවද තථ්‍ය ලැබීම් රු.449,978 ක් වීම නිසා රු.50,022 කින් අවම ලැබීම් සීමාවට ළඟා වී නොතිබුණි. | රජයේ අත්තිකාරම් කටයුතු සඳහා පාර්ලිමේන්තුව විසින් පනවා තිබූ සීමාවන් පිළිපැදිය යුතුවේ. | අවම ලැබීම් සීමාව රු.449,000 ක් ලෙස සංශෝධනය කිරීම සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගේ නිර්දේශය සඳහා ඉදිරිපත් කර ඇති බව BD/AA/231/23101/09/2019 හා 2019 දෙසැම්බර් 31 දිනැති ලිපිය මඟින් අප වෙත දන්වා එවා ඇත. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

**3.1 කාර්යසාධනය**

------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| (අ) 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වූ පසුගිය වර්ෂ 05 තුළ විසඳී ඇති නඩු ප්‍රතිශතය මුළු නඩු සංඛ්‍යාවෙන් සියයට 33 සිට සියයට 37 ක් දක්වා වූ පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.<br>එම වසර 05 තුළ වාර්ෂිකව දෙපාර්තමේන්තුවට අළුතින් ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව හා සමාලෝචනය සඳහා ඉදිරිපත් කර තිබුණු අයදුම්පත් සංඛ්‍යාව 394 සිට 464 ක ප්‍රමාණයක් ගෙන තිබුණි.<br>දිවයින තුළ දිස්ත්‍රික්ක 14 ක 2019 වර්ෂය සඳහා ලියාපදිංචි වී ඇති මුළු නඩු සංඛ්‍යාව 409 ක්වූ අතර ඉන් ගම්පහ, කුරුණෑගල සහ කොළඹ දිස්ත්‍රික්ක වලට අදාලව ලියාපදිංචි වී ඇති නඩු සංඛ්‍යාව පිළිවෙලින් 102 ක්, 69 ක් හා 65 ක් විය. | දෙපාර්තමේන්තුව පිහිටුවීමේ ප්‍රධාන අරමුණ නිශ්චල දේපල සම්බන්ධයෙන් උකස් කර, පොරොන්දු සින්නක්කර හා හුදෙක් ණය ගනුදෙනුවක් සඳහාම ලියන ලද සින්නක්කර ඔප්පු හා අනෙකුත් බැඳීම් කෙරෙහි අය වියයුතු ණය පිළිබඳව සම්මුතිවලට පාර්ශවයන් පැමිණ වීම බැවින් එම අරමුණු ඉටු කර ගැනීම කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතු වේ. | 2019 වර්ෂයේ දී ගම්පහ ශාඛා මණ්ඩලය පිහිටුවීමට අවශ්‍ය අවම ගෘහ භාණ්ඩ හා කාර්යාලයීය උපකරණ මිළදී ගැනීම් සිදු කරන ලදී. නමුත් ඒ සඳහා සුදුසු ගොඩනැගිල්ලක් ප්‍රසම්පාදනය කර ගැනීමට නොහැකි වීම හේතුවෙන් 2019 වර්ෂය තුළදී ගම්පහ ශාඛා මණ්ඩලය පිහිටුවීමට නොහැකි විය.<br>2020 ජනවාරි 16 දින කොළඹ, ගම්පහ, ගාල්ල හා කුරුණෑගල ශාඛා මණ්ඩල පිහිටුවීම සඳහා ණය සහනදායක මණ්ඩලයීය සාමාජිකයින් ලේකම්, අධිකරණ, මානව හිමිකම් හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය මගින් පත් කරන ලදී. |
| (ආ) 2019 දෙසැම්බර් 31 දිනට විසඳීමට ඇති මුළු නඩු සංඛ්‍යාව 821 ක්වූ අතර ඉන් සියයට 26 ක පමණ ප්‍රමාණයක් වසර 03 කට වඩා පැරණි නඩු විය. බොහෝ විට මෙම නඩු ප්‍රමාද වීමට පාර්ශවකරුවන්ගේ නොපැමිණීම හා අදාල සාක්ෂි ලබා ගැනීම් ප්‍රමාද වීම වැනි කරුණු ද බලපා තිබුණි. | ප්‍රමාදයන්ගෙන් තොරව නඩු විසඳීම සඳහා අවධානය යොමු කළ යුතුවේ. | ශාඛා මණ්ඩල පිහිටුවීම මගින් පාර්ශවකරුවන් ණය සහනදායක මණ්ඩලය ඉදිරියේ පෙනී සිටීමේ ප්‍රවණතාවය ඉහළ නැංවේ යැයි අපේක්ෂා කරන අතර එමඟින් ණය සහනදායක මණ්ඩලයේ ඉල්ලුම්පත් වැඩි වශයෙන් විමසීමට අපේක්ෂා කරනු ලබයි.<br>වසර 03ට වඩා පැරණි නඩු අතර නීතිමය කරුණක් පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණයේ නියෝගය අපේක්ෂාවෙන් ඉල්ලුම්පත් විශාල ප්‍රමාණයක් පැවති අතර 2020 ජුලි 14 දින |

| | | |
|---|---|---|
| | | ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගය ලැබී ඇත, ඒ අනුව එම ඉල්ලුම්පත් අවසන් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. |

## 4. මානව සම්පත් කළමණාකරණය

---------------------------------

### 4.1 සේවක මණ්ඩල පුරප්පාඩු

-------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 08 ක් විය. ඉන් ද්විතීයික මට්ටමට අයත් අනුමත ලඝු ලේඛක තනතුරු තුනම 2013 වර්ෂයටත් පෙර සිට පුරප්පාඩුව පැවතිණි. කළමණාකරණ සහකාර සේවයේ පුරප්පාඩු 03 ක් ද විය. | අත්‍යවශ්‍ය තනතුරු සඳහා පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුවේ. | ලඝු ලේඛක තනතුර සඳහා බඳවා ගැනීමේ පටිපාටිය සංශෝධනය කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත දන්වා යැවීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. කළමනාකරණ සේවා නිලධාරී සේවයේ පවතින පුරප්පාඩු පිළිබඳව 2019.11.27 දිනැතිව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉල්ලීම් කර ඇත. |

### 4.2 මානව සම්පත් සංවර්ධන සැලැස්ම

------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 ජනවාරි 24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ප්‍රකාරව රාජ්‍ය ආයතන තුල මානව සම්පත් සංවර්ධනය කිරීම මැයෙන් වූ චක්‍රලේඛයේ සඳහන් ඇමුණුම 02 ආකෘතිය පදනම් කර ගනිමින් මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කර නොතිබුණු අතර චක්‍රලේඛයේ ඇමුණුම 01 ආකෘතිය පදනම් කර ගෙන 2018 වර්ෂයේ සිට සිදු කළ යුතු සමස්ථ කාර්ය මණ්ඩලය සඳහා වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කිරීමද සිදු කර නොතිබුණි. | 2018 ජනවාරි 24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2018 වර්ෂයේ සිට දෙපාර්තමේන්තුව සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කර නොමැති අතර, 2020 වර්ෂය සඳහා චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීමට කටයුතු සිදු කරන බව දන්වමි. |

## 4.3 පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ආයතනය මගින් මහජනයාට ලබා දෙන සේවාවන් වඩාත් කාර්යක්ෂමව හා ඵලදායීව ලබා දීමට අවශ්‍ය පසුබිම සැකසීම සඳහා පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණු අතර ඒ පිළිබඳ අධීක්ෂණය සහ ඇගයීම සඳහා ක්‍රමවේදයක්ද සකස් කොට නොතිබුණි. | 2008 පෙබරවාරි 06 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 05/2008 ප්‍රකාරව පුරවැසි සේවා ලාභී ප්‍රඥප්තියක් පිළියෙල කළ යුතුවේ. | 2020 වර්ෂය සඳහා පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සකස් කිරීමට හා ඒ අනුව ක්‍රියාත්මක වීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. |